

# උක්ත අනුක්ත භේදය

දෙමාපියෝ දරුවන් සමග පාසලට යති.

ඉහත වාක්‍යයේ 'දෙමාපියෝ' යන්න කර්තෘ වෙයි. එය "යති" නමැති ආඛ්‍යාතය හා බැඳෙන උක්ත පදය යි. 'දරුවන්' යන පදය ක්‍රියාවට යටත් වන කර්ම පදය යි. එය අනුක්ත පදය වේ. මේ අනුව,

**"වාක්‍යයක අවසාන ක්‍රියා පදයෙන් කියැවෙන පදය උක්ත පදය යි. එසේ නො වන්නේ අනුක්ත පදය යි."**

උක්ත පද, අනුක්ත පද බවට හැරවෙන ආකාරයට නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

## සචේතන නාම පද

| උක්ත පද | අනුක්ත පද |
|---|---|
| මිනිසා | මිනිසා |
| මිනිස්සු | මිනිසුන් |
| ගුරුවරයා | ගුරුවරයා |
| ගුරුවරු | ගුරුවරුන් |
| බල්ලා | බල්ලා |
| බල්ලෝ | බල්ලන් |
| කාන්තාව | කාන්තාව |
| කාන්තාවෝ | කාන්තාවන් |
| කුමාරතුංගයෝ | කුමාරතුංගයන් |
| ගුරුළුගෝමීහු | ගුරුළුගෝමීන් |